# ක්‍රි.පූ අවධියේ පටන්ම ජලය හා බැඳි පූජා විධි හා සංස්කෘතිකාංග පැවති බවට කෙරෙන ඓතිහාසික විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජයසිංහ ජේ.එම්.සී.එච්.

මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ

chamodikahansini@gmail.com

**සාරසංක්ෂේපය**

විජයාවතරණයටත් පූර්වයේ ජන ජීවිතය ජලය සමඟ බැඳී තිබූ බව හෙළි කරන විජය කුවේණි කතා ප්‍රවෘත්තියේ විජය සිය පිරිසත් සමඟ දිය බීමට කුඩා වැවකට ගිය බවත්, එම වැව අසල කුවේණිය කපු කටිමින් සිටි බවත් දැක්වෙයි. කුවේණිය සිය කාර්යයන් වැව ආශ්‍රිතව සිදු කිරීමෙන් ඒ වන විටත් ගොඩනැඟී තිබුණු වාපී සංස්කෘතිය පිළිබිඹු වෙයි. ජලය හා බැඳුණු සංස්කෘතියක් හා ඒ වටා හැඩ ගැසුණු සංස්කෘතිකාංග රැසක් අනුරාධපුර යුගයේ සිට නිර්මාණය වී තිබුණි. මෙලෙස ජලය කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන සංස්කෘතිකාංග පුරාතන අවධියේ පටන් ම තිබූ බව විමර්ශනය පර්යේෂණ අරමුණයි. අධ්‍යයන ක්‍රමවේදය වන්නේ සාහිත්‍යමය මූලාශ්‍රයයන් පරිශීලනය කරමින් එතුළින් නිගමනය කර ගත් කරුණුය. ක්‍රි.පූ හයවන සියවසේ පටන් නිසි කළට වැසි ලබා ගැනීම වෙනුවෙන් 'ජෙට්ඨමූල' උත්සවයක් පැවතුණු බවට සාධක ක්‍රි.ව 914 - 924 අතර රජ කළ කාශ්‍යප රජුගේ ශිලා ලිපියකින් තහවුරු වෙයි. එහි 'පර්ජුන' යන පදය 'පොජොන්' හා 'පොසොන්' වශයෙන් බිඳී ආ බව දැක්වෙයි. ආර්යයන් ලංකාවට පැමිණීමට පෙර 'පර්ජන්‍ය' නමින් ජලය හා සම්බන්ධ දෙවියෙක් ඇදහූ බව වේද සාහිත්‍යයේ දැක්වෙයි. ලංකාවට පැමිණි ආර්යයන් මෙම දෙවියාව ඇදහූ අතර ලක්දිව දී මෙම දෙවියා හඳුන්වා ඇත්තේ 'පජ්ජුන' යනුවෙනි. ජුනි මාසයේ ගිරි හිස් මුදුන් මත පොජොන් දෙවියා වෙනුවෙන් පැවැත්වූ උත්සවය 'ජෙට්ඨමූල උත්සවය' වෙයි. පජ්ජුන කලක් යාමේදී පොජොන් ලෙසත් පසුව පොසොන් බවටත් පත් වී ඇත. දේවානම්පියතිස්ස රාජ්‍ය සමය වන විටත් මේ ආගමික උත්සවය පැවති බවට මහාවංශය සාක්ෂි සපයයි. මෙය ක්‍රි.ව දසවන සියවසේදීත් පැවති බව පස්වන කාශ්‍යප රජුගේ අභිලේඛනයකින් සනාථ වේ. චූලවංශයට අනුව උග්‍ර නියං කාලවලදී සිරිසඟබෝ වැනි පාලකයින් සත්‍යග්‍රහ කොට වර්ෂාව ලබා ගැනීම පිළිබඳව තොරතුරු දැක්වෙයි. කීර්ති ශ්‍රී මේඝවර්ණ අවධියට අයත් ෆාහියන් වාර්තාවල දළදා පූජා පිළිබඳව දැක්වෙන අතර "වැසි නොවස්නා කළ මෙලෙසින් දළඳා පූජා කරන නිසා ජලය ලැබෙන බව" දළදා සිරිතේ සඳහන් වෙයි. ක්‍රි.ව තෙවන සියවසේ උත්තිය රජ සමයේ පිරිත් සජ්ඣායනා සඳහා ජලය පදනම් කර ගත් බවට සාධක හමු වී ඇත. විශේෂයෙන් ම මහාවංශයේ දසවන පරිච්ඡේදයෙන් විස්තර වන පණ්ඩුකාභය වෘත්තාන්තයට අනුව රජු සිය අභිෂේකය සඳහා විලක් විශාල කර බව සඳහන් වෙයි. මේ අනුව පාලකයින් සිය අභිෂේක උත්සව ජලය මූලික කරගෙන පැවැත්වූ බව සනාථ වෙයි. මෙලෙස පුරාතන අවධියේ පටන්ම ජලය හා බැඳි විවිධ පූජා විධි හා සංස්කෘතිකාංග පැවති බවත් පාලකයින් ඒවා සිදු කළ බවත් ධ්වනිත වෙයි.

**ප්‍රමුඛ පද:** *ජලය, පූජා විධි, සංස්කෘතිකාංග, ආගමික, පුරාතන*